සන්නස
SANNASA

## සුව සටහන්



වෛද්‍ය
හර්ෂ අලුත්ගේ
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre



# Work Cover Claims

## වැඩපළ ආශ්‍රිතව සිදුවන අනතුරු/රෝගාබාධ හා වන්දි ලබා ගැනීම

වික්ටෝරියා ප්‍රාන්තයේ ජීවත්වන ඔබ යම් කිසි රැකියාවක නිරතවේ නම් වැඩපලේදී සිදුවන අනතුරු හෝ රැකියා ආශ්‍රිත වෙනත් රෝගාබාධ සඳහා වන්දි/වෙනත් සහන ලබා දෙන Work Cover නැමැති රක්‍ෂනාවරණ ක්‍රමය ගැන අසා ඇතුවාට සැකයක් නැත.

සමහරවිට බොහේ දෙනෙකු තම රැකියායාවට අදාල සිදුවන රෝගාබාධ වලින් පෙලෙන නමුදු ඉහත කී උදරන Cover ක්‍රමය ගැන නිසි අවබෝධයක් නොමැති නිසා එමගින් ලබාගත හැකි සහන නොලබා සිටිනවාද විය හැක. එබැවින් කෙලින්ම රෝගයක් ගැන විස්තර කරන මාතෘකාවක් නොවුනත් අප සමාජයේ බොහෝ දෙනෙකුට දැනගැනීමට අවශ්‍ය කාලීන මාතෘකාවක් වන මෙය ගැන අද ලිපියෙන් සාකච්ඡා කිරීමට මම අදහස් කළෙමි.

### Work Cover Claims කල හැක්කේ කාටද?

තම රැකියාව ආශ්‍රිතව සිදුවන අනතුරු හෝ වෙනත් ආබාධ වලදී එම රෝගාබාධ ඇතිවීම සඳහා තම හැකියාවව සැලකිය යුතු ලෙස දායකත් වයක් සපයයි නම් ඔහුට/ඇයට Work Cover සඳහා ඉල්ලුම් කළ හැකිය.

- ශාරීරික ආබාධ / අනතුරු
- මානසික ආබාධ විශේෂයෙන් වැඩපළ වලදි සිදුවන හිරිහැර හා වෙනත් අකටයුතුකම්
- Bullying / Harasment
- Exposure Illness (උදා : විෂ රසායන ද්‍රව්‍ය හෝ දුම අදියට නිරාවරණය වීමෙන් ඇතිවන පෙනහලු ආබාද)

- සාමාන්‍යයෙන් Independent Contractors හා ස්වේච්ඡා සේවකයන් (Volunteers) හැර අනෙකුත් රැකියා කරන අය මේ සඳහා සුදුසුකම් ලබති.

### How to Lodge a Claim

තම රෝගී තත්වය පිළිබඳව රැකියා ස්ථානයේ ප්‍රධානියා හෝ වගකිවයුතු නිලධාරියෙකුට දැන්විය යුතු අතර ලියකියවිලි සම්පූර්ණ කළ යුතුයි. ඉන් පසු ඔවුන් විසින් එය අත්සන් කර දින 10 ක් ඇතුලතදී රක්‍ෂණ ආයතනය වෙත යැවිය යුතුය.

එසේම රැකියාවට නොයා සිටීමෙන් අහිමි වන ආදායම ලබා ගැනීමට වෛද්‍යවරයෙකු හමුවී Cartificate of Capacity හෙවත් පොදුවේ හඳුන්වන Work Cover Certificate නැමැති ලියවිල්ල ලබාගෙන එයද තම හිමිකම් අයදුම්පත් පත්‍රය සමග යැවිය යුතුය.

### When Must a Claim be Lodged

අංකුර හෝ රෝගී තත්වය දැනගැනිමට ලැබී දින 30 ක් ඇතුලත

### What can be claime

- වෛද්‍ය ප්‍රතිකාර සඳහා යන වියදම්
- සතිපතා තම වැටුපෙන ප්‍රතිශතයක්
- Impairment Benefits අබාධි තත්තවය සඳහා ලැබෙන හිමිකම්
- Common Law Damages
- වේදනාව හා විඳවීම සඳහා
- ආදායම අහිමිවීම සඳහා

විශේෂයෙන් රැකියා ස්ථානයේ වරදින් හෝ අතපසුවීම් වලින් සිදුවන අනතුරු/ රෝග සඳහා මෙම හිමිකම් අදාලවේ.

### සතිපතා ලැබෙන ගෙවීම් ප්‍රමාණය හා කාලය?

- සති 13 ක් දක්වා තම වැටුපෙන් 95% ගෙවනු ලැබේ
- සති 1452 දක්වා වැටුපෙන් 80% ක් ගෙවනු ලැබේ
- සති 53 සිට 130 දක්වා දක්වා වැටුපෙන් 80% ක් ගෙවන අතර අනතුරුව පෙර අතිකාල හා වෙනත් දීමනා ඇත්නම් එය අඩු කරණු ලැබේ.
- සති 130 ක් පසු ගෙවීම් ලැබීමට නම් සදහටම වැඩකිරීමට නොහැකියාව ක් (Parmament Incapacity) තිබිය යුතුය

බෝහෝ විට මෙම අවධිය වන විට ඔබගේ නිතිඥයන් විසින් පහත සඳහන් හිමිකම් 2ක් එකකට හේ සමහර විට දෙවර්ගයම සඳහා අයදුම් කරනු ලැබේ.

Impaiement Benefits ඔබගේ රෝගය හෝ අනතුර බරපතල නම් හා ඔබට නැවත කිසි දිනක ඔබගේ සාමාන්‍ය රැ කියාව කළ නොහැකි නම් මෙම හිමි කම සඳහා අයදුම් කරනු ලැබේ. එහිදී එකවර යම් මුදලක් ලබා ගැනීම සිදු කරයි. මේ සඳහා වෛද්‍යවරුන් විසින් ඔබ සදාකාලිකවම තම රැකියාව කළ නොහැකි බවට සහතිකයක් ලබා දිය යුතුයි. මෙය Parmant Incapacity Certificate ලෙස හඳුන්වයි.

### Common Law Claim

ඔබගේ අනතුරු හෝ රෝගය සඳහා සේවාදායකයාගේ පැත්තෙන් සිදු වූ නොසැලකිලිමත් කමක් හෝ අතපසුවීම ක් ඉවහල්වුයේ නම් හා ඔබගේ අනතුර හෝ රෝගය බරපතල නම් ඔබට මෙම හිමිකම සඳහා ඉල්ලුම් කළ හැක. එසේම ඉහත සඳහන් කළ Impairment Benefit හිමිකම සඳහා ඉල්ලුම්කරනවිට 30% ට වඩා අබාධිත තත්වයක් ඇතිනම් මෙම හිමිකම් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා වක් පවතී. මෙම හිමිකම අනතුර හෝ රෝගය සිදුවී අවුරුදු 6 ක් යනතුරු ඉල්ලුම් කල හැකිවේ.

### Work Cover ක්‍රියාවලියේදී ඇතිවන ගැටලු මොනවාද?

- හිමිකම ප්‍රතික්ෂේප කිරීම (Rejection of Claim)
- සතිපතා ගෙවීම් නතර කිරීම
- හිමිකමට වඩා අඩු ප්‍රමාණයක් ගෙවීම
- වෛද්‍ය හා වෙනත් ප්‍රතිකාර වලට යන වියදම් නිසි පරිදි මෙහෙයවීම

### ඉහත ගැටලු පැන නැගුනු විට කල යුත්තේ කුමක්ද?

මේ සඳහා උදරන Cover ක්‍රියාවලිය පිළිබඳ දැනුමක් ඇතිනීතිඥවරයෙකු හමුවීම වඩා සුදුසුය. ඔවුන් විසින් ඉදිරියට කලයුතු දේ පිළිබඳව උපදෙස් ලබා දෙනු ඇත.

- සතිපතා ගෙවීම හා වෛද්‍ය ප්‍රතිකාර වියදම් පිළිබඳ ගැටලු හා ආබාධිත තත්වය පිළිබඳ ගැටලු විසළීම සඳහා Accidnet Compen-sation Conciliation Sercice (ACCS) නැමැති අධිකාරිය පිහිටුවා ඇත.

සමහරවිට වෛද්‍ය මණ්ඩලයක් (Medical Panel) සඳහා යොමු කරනු ලැබිය හැක. ඉහත ක්‍රම වලින් විසඳිය නොහැකි ගැටලු මහේස්ත්‍රාත් අධික රණයක් ඉදිරියේ නඩු පැවරීමෙන් විසඳහා ගත හැක.

Common Law Claims සඳහා වන ගැටලු Country Court Uictoria or Supreme Court Victoria වලට යොමු කළ යුතුය.

### වැඩිපුර විස්තර ලබාගතහැකි ක්‍රම

මූලිකව මෙම ලිපියේ අරමුණ වන්නේපොදුවේ රැකියාව ආශ්‍රිත රෝගාබාධ සඳහා සහන ලබා ගැනීමට ඇති ක්‍රම පිළිබඳ දළ අවබෝදයක් ලබා දීමයි.

මෙහි සඳහන් සමහර වචන හා යෙදුම් සාමාන්‍ය කෙනෙකුට තේරුම් ගැනිමට තරමක් අපහසු විය හැකිය. නමුත් ඔබට ඒ ගැන දල අවබෝධයක් ඇති වීම ඒ ගැන වැඩිදුර කටයුතු කිරීමේදී වඩාත් පහසු වේ.

ඔබගේ පවුලේ වෛද්‍යවරයා මගින් නීතීඥයෙකු මගින් Work Safe Unoctoria වෙතින් හෝ සමහරවිට ඔබ දන්නා හඳුනන හිමිකම සාර්ථකව Work Cover ලබාගත් අයෙකුගෙන් වුවද වැඩිදුර උපදෙස් ලබා ගත හැකිය.